## ලබා ගත හැකි ප්‍රතිලාභ

හොඳ ගුණාත්මයකින් යුතු බඳුන්ගත රිකිලි තේ පැලයක් සාමාන්‍යයෙන් වෙළඳපොලේ රු. 15.00 සිට 18.00 වැනි මිලකට අලෙවි කරන්න පුළුවන්. මේ අනුව පැල 5000 ක වගේ තවානකින් වසරක් වැනි කාලයක් තුල රු.30,000-40,000 ක විතර ලාභයක් කලා ගැනීමේ හැකියාව තියෙනවා. අමතර ආදායමක් විදියට මෙය සැළකිය යුතු මුදලක්. ඒ වගේම තවානෙහි යොදන පැල ගණන වැඩි කර ගන්න පුළුවන් නම් සැළකිය යුතු මුදලක් උපයා ගැනීමේ හැකියාව තිබෙනවා.

## තාක්ෂණික උපදෙස්

තවානක් ක්‍රියාත්මක කරන්න විශේෂඥ තාක්ෂණික දැනුමක් අවශ්‍ය වෙන්නේ නැහැ. පලපුරුද්දත් එක්ක තවාන් කටයුතු ඉතා පහසුවෙන් කරන්න පුළුවන්.

කුඩා පරිමාණ ව්‍යාපෘතියක් විදියට තවානක් ආරම්භ කරනවා නම් ඒ වගේ කණ්ඩායමකට අවශ්‍ය පුහුණුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වගේ තැනකින් පහසුවෙන් ලබා ගන්න පුළුවනි.

ඒ විතරක් නොවෙයි. ඔබට අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දෙන්න ඕනෑම වෙලාවක ප්‍රදේශයේ තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරී මහතා සැදී පැහැදී ඉන්නවා.

## ගැටළු හා විසඳුම්

තවානක් ක්‍රියාත්මක කිරීම හුඟක් සංකීර්ණ ක්‍රියාවලික් නොවෙයි. ඒ නිසා සාමාන්‍යයෙන් ඇති වන ඕනෑම ගැටළුවකට පහසුවෙන් විසඳුම් හොයා ගන්න පුළුවනි.

තවාන ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය යෙදවුම් සපයා ගැනීම ලොකු ගැටළුවක් නොවෙයි. අවශ්‍ය සියළුම යෙදවුම් පාහේ සාමාන්‍ය වෙළඳපොලෙන් ලබා ගන්න පුළුවන්.

දැනට තේ පැල සඳහා තිබෙන ඉල්ලුම අනුව හොඳ ගුණාත්මයෙන් යුතු පැලයක් නිෂ්පාදනය කරනවා නම් අලෙවි ගැටළු ඇති වෙන්නේම නැති තරම්. කෙසේ වෙතත් නිෂ්පාදනය කෙරෙන පැල අලෙවි කර ගැනීමට සහාය අවශ්‍ය නම් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට මැදිහත් වෙන්න පුළුවනි.

තවාන ප්‍රියාත්මක කිරීමේදී කාලීනව ඇති විය හැකි තාක්ෂණික ගැටළු සම්බන්ධයෙන් පූර්ණ උපදෙස් මේ වගේ පත්‍රිකාවකින් ලබා දීම අපහසුයි. ඒ නිසා එවැනි අවස්ථාවකදී කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ව්‍යාප්ති නිලධාරි මහතකුගේ සේවය පහසුවෙන්ම ලබා ගත හැකියි.

## සම්බන්ධීකරණ ආයතන හා නිලධාරීන්

ආදායම් ඉපයීමේ සුළු පරිමාණ ව්‍යාපාතියක් ලෙස රිකිලි තේ තවානක් ආරම්භ කිරීමේදී බිම් මට්ටමේ සම්බන්ධීකරණය සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශ වල ගම් මට්ටමේ ස්ථාන ගත කර සිටින කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන් කටයුතු කරනු ඇති. මෙයට අමතරව එම ආයතනයේ ඕනෑම කාර්යාලයක් ඇමතීමෙන් ඔබට අවශ්‍ය සහාය ලබා ගත හැකියි.

*කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය*
*අංක 70, පාර්ලිමේන්තු පාර,*
*පැලවත්ත, බත්තරමුල්ල*
*දුරතථනබ - 011 7909021, 011 7909020*
*ඊ මේල් - gmtshda@gmail.com*
*dgmetshda@gmail.com*

*වැඩිදුර උපදෙස් සඳහා ඔබගේ ප්‍රදේශයේ තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරී මහතා හමුවන්න. ඔහු ඔබට අවශ්‍ය උපදෙස් නොමිලයේ සපයනු ඇත.*

*සැකසුම*
*ව්‍යාප්ති අංශය*
*කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය*

**ගෙවතු දස ලක්ෂය සහ ආර්ථික ඒකක සංවර්ධන වැඩ සටහන - 2011**



# කුඩා පරිමානයේ රිකිලි තේ තවානක් අරඹමු

**ඉදිරිපත් කිරීම**
**වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**
**සහ**
**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය**

## හැඳින්වීම

සියළුම තේ වගා කරන ප්‍රදේශ වල අනුමත තේ ප්‍රභේද වල බඳුන්ගත රිකිලි තේ පැල සඳහා හොඳ ඉල්ලුමක් තිබෙනවා. ඒ නිසා ආදායම් ඉපයීමේ කෙටි කාලීන ව්‍යාපාරයක් ලෙස කුඩා පරිමාණයේ රිකිලි තේ තවාන් පවත්වාගෙන යාම ඉතාමත් සාර්ථකව කරන්න පුළුවන්. සාමාන්‍යයෙන් පැල 5000 ක පමණ කුඩා පරිමාණයේ තවානකට අවශ්‍ය වන ශ්‍රමය පවුලේම ශ්‍රමයෙන් පිරිමසා ගන්නට පුළුවන් නිසා වැඩි ආයාසයක් දරන්න අවශ්‍ය වෙන්නෙත් නැහැ.

## මූලික අවශ්‍යතා හා යෙදවුම්

තවානක් ආරම්භ කිරීමේදී මූලිකම අවශ්‍යතාවය තමයි ඒ සඳහා සුදුසු ස්ථානයක්. මේ ස්ථානය නිරන්තර ජල පහසුකම් ඇති, වදුල හෝ අධික සෙවනින් තොර, සමතලා හෝ මඳ බෑවුම් සහිත හොඳින් ජලය බැස යන ස්ථානයක් විය යුතුයි. තදින් සුලඟ නොමැති මීදුම් ගතියෙන් තොර ස්ථානයක් වීමත් ආරම්භ කරන තවානේ සාර්ථකත්වයට දායක වෙනවා. මාර්ග පහසුකම් ඇති ස්ථානයක් වීම පැල අලෙවියේදී පහසුවක්. පැල 5000 පමණ තවානක් පවත්වා ගෙන යන්න පර්චස් 5-6 ක බිම් ප්‍රමාණයක් ප්‍රමාණවත්.

මීලග අවශ්‍යතාවය තමයි හොඳ තවාන් පසක්. මේ සඳහා ලොකු මුල් හා ගල් කැබලි වලින් තොර වැලි ලෝම පසක් අවශ්‍යයි. යොදා ගන්නා පස මඳක් ආම්ලික ගතියෙන් යුතු වෙන්න ඕනෑ. යොදා ගන්නා පස සුදුසුද කියලා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරී මහතෙකුට කියලා පරීක්ෂා කරවා ගන්න පුළුවනි.

තේ තවානක රිකිලි සිටුවන්න ඕනෑ පොලිතීන් මළු වල. මේ සඳහා භාවිතා කරන්නේ ගේජ් 150 ඝණකමින් යුතු විනිවිද පෙනෙන පොලිතීන් මළු. මළු වල පලල අඟල් 5 (සෙ.මී 12.5) හා අවම උස අඟල් 7 (සෙ.මී 17.5) ක් වෙන්න ඕනෑ. සාමාන්‍යයෙන් වෙළඳ පොලේ බොහෝ තැන් වලින් මේ පොලිතීන් පහසුවෙන් මිලට ගන්න පුළුවන්.

තවානට අවශ්‍ය රිකිලි අතු නිර්දේශ කරන ලද ප්‍රභේද වල මව් පඳුරු වලින් ලබා ගන්නට පුළුවන් නම් වඩාත් හොඳයි. අළුත් ප්‍රභේද වල හොඳ පැල වලට හොඳ ඉල්ලුමක් තිබෙන නිසා අලෙවිය ඉතාමත් පහසුයි. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා තේ පර්යේෂණායතනය මගින් පවත්වා ගෙන යන නව වැඩි දියුණු කල ප්‍රභේද වල මව් වගාවන්ගෙන් රිකිලි ලබා ගන්න එහෙම නැත්නම් පුද්ගලික ඉඩමකින් රිකිලි ලබා ගන්න පුළුවන්. මේ සඳහාත් ප්‍රදේශයේ තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරී මහතාගේ සහාය ලබා ගන්න පුළුවනි.

කුඩා පරිමාණයේ තවානකට අවශ්‍ය සෙවන සපයන්න ප්‍රදේශයෙන් සපයා ගත හැකි ද්‍රව්‍ය භාවිතා වන සරල තාක්ෂණය යොදා ගත හැකි නිසා වැඩි වියදමක් යන්නේ නැහැ.

තවානට අවශ්‍ය ටී 65 හා සින්ක් සල්ෆේට් වැනි පොහොර වර්ගත් අවශ්‍ය විය හැකි කෘෂි රසායන වර්ගත් සාමාන්‍යයෙන් වෙළඳපොලෙන් පහසුවෙන් මිලදී ගන්න පුළුවන්.

මෙයට අමතරව උදළු, මුල්ලු, බාල්දි, මල් බාල්දි වැනි සරල කෘෂි උපකරණ සීමිත ප්‍රමාණයක් අවශ්‍යයි. තවාන් කටයුතු සඳහා දියර ඉසින යන්ත්‍රයක් අවශ්‍ය වන නමුත් මූලික අවස්ථාවෙහිදී මෙවැන්නක් මිලට නොගෙන අන් ක්‍රමයකින් අවශ්‍ය අවස්ථාවකදී සපයාගන්න පුළුවන් නම් වඩාත් හොඳයි.

## ආරම්භක වියදම

සුළු පරිමාණයේ තවානක් ආරම්භ කිරීම සඳහා තවාන් බිම හා පාත්ති සැකසීම වගේ ආරම්භක කාර්යයන් සඳහා ශ්‍රමය වැඩි වශයෙන් අවශ්‍ය වුණත් ඉන්පසු කෙරෙන එතිනෙදා කටයුතු සඳහා එතරම් කම්කරු ශ්‍රමයක් අවශ්‍ය වෙන්නේ නැහැ. මේ සඳහා පවුලේ ශ්‍රමය පහසුවෙන් යොදා ගන්න පුළුවන්.

කෘෂිකාර්මික උපකරණ වගේ දිගු කාලයක් භාවිතා කරන්න පුළුවන් දේවලට ආරම්භයේදී කිසියම් වියදමක් දරන්න සිදු වුණත් එම උපකරණ තවාන් වාර කිහිපයක් භාවිතා කරන්න පුළුවන් නිසා වසරකට දරන්න වෙන වියදම සම්පූර්ණ වියදමෙන් කොටසක් පමණයි.

පැල 5000 ක පමණ තවානක් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වෙන වාර්ෂික යෙදවුම් පහත දැක්වෙනවා. මේවා ප්‍රදේශයේ පවතින වෙළඳපොල අනුව මිල කර ගන්න පුළුවනි.

| ද්‍රව්‍යය | ප්‍රමාණය |
|---|---|
| මළු සඳහා ගේජ් 150 පොලිතීන් | කිලෝ 10 පමණ |
| තවාන් පස් | කියුබ් 10 පමණ |
| ධූමකරණය සඳහා රසායන (ප්‍රදේශය අනුව) | කිලෝ 5 පමණ |
| රිකිලි කැබලි | 5800 පමණ |
| ටී 65 පොහොර | කිලෝ 40 පමණ |
| සින්ක් සල්ෆේට් | ග්‍රෑම් 250 පමණ |
| කෘෂි රසායන | අවශ්‍යතාවය අනුව |

මේ අනුව සියළුම වියදම් ඇතුළුව පැලයක් රු. 8.00 ත් 10.00 ත් අතර මිලකට පහසුවෙන් නිෂ්පාදනය කර ගන්න පුළුවන්.

## ව්‍යාපෘති කාල වකවානු

තවාන ක්‍රියාත්මක කරන ප්‍රදේශ අනුව ආරම්භ කල යුතු හා ක්‍රියාත්මක කල යුතු කාල වකවානු වෙනස් වෙනවා. සාමාන්‍යයෙන් නිරිත දිග මෝසම් කලාපයේ නම් තවානේ මූලික කටයුතු වසරේ මාර්තු-අප්‍රේල් කාලයේදී ආරම්භ කලාම ඊලඟ වසරේ මැයි-ජූනි විතර වෙනකොට පැල අලෙවි කිරීම කරන්න පුළුවන්.

ඊසාන දිග මෝසම් කලාපයේ නම් මැයි-ජූනි කාලයේ තවාන් කටයුතු ආරම්භ කලාම ඊලඟ වසරේ ඔක්තෝබර්-නොවැම්බර් කාල වකවානුවේදී පැල අලෙවිය කරන්න පුළුවන්.

මේ අනුව සමස්ත ව්‍යාපෘති කාලය වසරක් හෝ ඊට ආසන්න කාලයක්.